www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

***සසප/ලෝසවෙඅ ගිම්හාන පාසල 2005***

# පලමු වැනි දේශනය: රුසියානු විප්ලවය සහ විසිවන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු

***පලමු වන කොටස***

**Lecture one: The Russian Revolution and the unresolved historical problems of the 20th century**

**Part 1**

**ඩේවිඩ් නෝත් විසිනි**
**2005 අගෝස්තු 29**

*2005 අගෝස්තු මස 14 වැනිදා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඈන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ "රුසියානු විප්ලවය සහ විසිවන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු" යන දේශනයේ පලමු කොටස යි මේ. මේ දේශනය කොටස් හතරකින් පල කෙරේ. මෙය පාසලෙහි පැවැත්වුනු පලමුවන දේශනය යි.*

## ඓතිහාසික ඥානය හා පන්ති විඥානය

අද අපි "මාක්ස්වාදය, ඔක්තෝබර් විප්ලවය සහ හතරවන ජාත්‍යන්තරයේ ඓතිහාසික පදනම්" යන මැයින් සතියක් පුරා පැවැත්වෙන දේශන මාලාව ආරම්භ කරන්නෙමු. මේ දේශන තුල දී හතරවන ජාත්‍යන්තරය මතු ව ආවා වූ ඓතිහාසික සිදුවීම්, න්‍යායික විවාද හා දේශපාලන අරගල විභාග කිරීමට අපි අදහස් කරමු. මේ දේශනවල කේන්ද්‍රීය අවධානය යොමු වනු ඇත්තේ විසිවන සියවසේ මුල් 40 වසර වෙතට ය. මේ සීමා කිරීම යම් තාක් දුරකට අපට ඇති කාල ප්‍රමානය විසින් නිර්නය කෙරුනකි. සතියක් තුල ඉටුකරගත හැකි දෑ බොහෝ තිබේ. යන්තම් දින හතක් තුල අවසන් ශතවර්ෂයේ මුල් දශක හතර පමනක් ඔස්සේ පවා වැඩ කිරීම යනු ඇත්තෙන් ම අභිලාෂී භාරගැනීමකි. එහෙත් 1900 සහ 1940 අතර කාලපරිච්ඡේදය වෙත අපේ අවධානය යොමු කිරීම තුල නිශ්චිත ඓතිහාසික තර්කනයක් පවතී.

1940 ලියොන් ට්‍රොට්ස්කි ඝාතනය සිදු වන විට විසිවන සියවසේ සාරභූත දේශපාලන ස්වරූපය නිර්නය කලා වූ සියලු ප්‍රධාන සිදුවීම් හටගෙන අවසන් ව තිබිනි. 1914 අගෝස්තුවේ පලමු ලෝක යුද්ධය පුපුරා ඒම; බෝල්ශෙවික් පක්ෂය 1917 ඔක්තෝබරයේ දී බලය ලබාගැනීම හා ඉන් පසු ලොව පලමු කම්කරු රාජ්‍යය වසයෙන් සෝවියට් සංගමය ස්ථාපිත කිරීම; පලමු ලෝක යුද්ධයෙන් පසුභාගයේ දී එක්සත් ජනපදය බලගතු ම අධිරාජ්‍යවාදී රාජ්‍යය වසයෙන් ඉස්මතු ව ඒම; 1923 ජර්මානු විප්ලවයේ පරාජය, සෝවියට් සංගමයේ නිලධාරීතාන්ත්‍රික පරිහානිය, 1927 දී වාම විපාර්ශ්වයේ පරාජය සහ ට්‍රොට්ස්කි කොමියුනිස්ට් පක්ෂයෙන් හා තුන්වන ජාත්‍යන්තරයෙන් නෙරපනු ලැබීම; 1926-27 කාලයේ දී චීන විප්ලවය පාවාදෙනු ලැබීම; 1929 දී වෝල් වීදියේ කඩාවැටීම සහ ලෝක ධනවාදී අවපාතයේ ආරම්භය; 1933 දී හිට්ලර් බලයට පැමිනීම සහ ජර්මනියේ නාසිවාදයේ ජයග්‍රහනය; 1936-38 මොස්කව් අවනඩු විභාග සහ සමාජවාදී බුද්ධිමතුන්ට හා කම්කරු පන්තියට එරෙහි ව සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල දියත් කෙරුනු දේශපාලන සංහාරය; ස්ටැලින්වාදී නායකත්වයෙන් යුත් මහජන පෙරමුනේ අනුග්‍රහය යටතේ 1937-39 ස්පාඤ්ඤ පාවාදීම හා විප්ලවය පරාජය කිරීම; 1939 සැප්තැම්බරයේ දී දෙවන ලෝක යුද්ධය පුපුරා ඒම; සහ යුරෝපීය යුදෙව්වන් සමූලඝාතනය ආරම්භ කිරීම.

විසිවන සියවසේ දේශපාලන ස්වරූපය නිර්නය කෙරුනේ මේ දශක හතර තුල දී ය යි කියන විට අප එය අදහස් කරන්නේ පහත දැක්වෙන අර්ථයෙනි: පශ්චාත්-දෙවන ලෝක යුද්ධ කාලපරිච්ඡේදය තුල ජාත්‍යන්තර කම්කරු පන්තිය මුහුන පෑ සියලු ප්‍රධාන දේශපාලන ගැටලු අවබෝධ කරගත හැකි වනුයේ පූර්ව-දෙවන ලෝක යුද්ධ සමයේ ප්‍රධාන විප්ලවවාදී හා ප්‍රතිවිප්ලවවාදී අත්දැකීම්වල මූලෝපායික පාඩම් නමැති ප්‍රිස්මය හරහා විභාග කල කල්හි පමනකි.

දෙවන ලෝක යුද්ධයෙන් පසු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල ප්‍රතිපත්ති විශ්ලේෂනය කිරීම සඳහා 1914 අගෝස්තුවේ දෙවන ජාත්‍යන්තරයේ බිඳවැටීමේ ඓතිහාසික ඇඟවුම් අවබෝධ කරගැනීම අවශ්‍ය වේ; සෝවියට් සංගමයේත්, දෙවන ලෝක යුද්ධයට පසු නැගෙනහිර යුරෝපයේ ස්ථාපනය කෙරුනු

තන්ත්‍රයන්ගේත්, 1949 ඔක්තෝබරයේ දී චීනයේ ස්ථාපිත මාවෝවාදී තන්ත්‍රයේත් ස්වභාවය අවබෝධ කරගත හැකි වනු ඇත්තේ ඔක්තෝබර් විප්ලවය සහ පලමු කම්කරු රාජ්‍යයේ දිග්ගැස්සුනු පරිහානිය පිලිබඳ අධ්‍යයනයක පදනම මත පමනි. තව ද ආසියාව, මැද පෙරදිග, අප්‍රිකාව හා ලතින් ඇමෙරිකාව සිසාරා 1945න් පසු පැතිර ගිය මහා විජිත විරෝධී හා අධිරාජ්‍ය විරෝධී විප්ලව රැල්ල පිලිබඳ ගැටලුවලට පිලිතුරු සොයාගත හැක්කේ 1905 දී මුලින් ම සංග්‍රහ කෙරුනු ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය වටා පැනනැගි දේශපාලනික හා න්‍යායික විවාදයන් පිලිබඳ පරිශ්‍රම දරා කෙරෙන අධ්‍යයනයක පදනම මත පමනි.

ඓතිහාසික ඥානය සහ දේශපාලන විශ්ලේෂනය හා හැඩගැස්ම අතර සබඳතාව සිය ප්‍රගාඪතම ප්‍රකාශනය සොයාගත්තේ සෝවියට් සංගමයේ අවසන් දශකය තුල ය. 1985 මාර්තු මස මිහයිල් ගොර්බචෝව් බලයට පැමිනි කාලය වන විට ස්ටැලින්වාදී තන්ත්‍රය දරුනු අර්බුදයක පැවතිනි. සෝවියට් ආර්ථිකයේ පරිහානිය, 1970 ගනන්වල ශීඝ්‍ර නැගීමකින් කෙටිකාලීන හදිසි ලාභ සපයා දුන් තෙල් මිල තියුනු ලෙස ඇද වැටෙන්ට වූ කල්හි තවදුරටත් සඟවා තැබිය නො හැකි විය. පරිහානිය ආපසු හැරවීමට ක්‍රෙම්ලිනය ගැනීමට නියමිත වූයේ කුමන පියවර ද? පිලිවෙත් පිලිබඳ ප්‍රශ්න සැනෙකින් ම සෝවියට් ඉතිහාසය පිලිබඳ පිලිතුරු නොසැපයුනු ප්‍රශ්න හා පැටලී ගති.

වසර හැටකටත් වැඩි කාලයක් තිස්සේ ස්ටැලින්වාදී තන්ත්‍රය ක්‍රෑරතර ඓතිහාසික සාවද්‍යකරන ව්‍යාපෘතියක නිමග්න ව සිටියේ ය. සෝවියට් සංගමයේ පුරවැසියෝ තමන්ගේ ම විප්ලවවාදී ඉතිහාසය පිලිබඳ කරුනු ගැන විශාල වසයෙන් නොදැනුවත් වූහ. ට්‍රොට්ස්කිගේත් ඔහුගේ සමචින්තකයන්ගේත් කෘති දශක ගනනාවක් තිස්සේ වාරනය ද යටපත් ද කොට තිබුනේ ය. සෝවියට් ඉතිහාසය පිලිබඳ එක ද විශ්වසනීය කෘතියක් හෝ නො වී ය. නිල සෝවියට් විශ්ව කෝෂයේ සෑම නව සංස්කරනයක් ම ක්‍රෙම්ලිනයේ දේශපාලන අභිලාෂයන්ට හා උපදෙස්වලට අනුකූල ව ඉතිහාසය සංශෝධනය කලේ ය. අපේ අභාවප්‍රාප්ත සහෝදර වඩිම් රොගොවින් වරක් සඳහන් කල පරිදි සෝවියට් සංගමය තුල අතීතය ද අනාගතය සේ ම අවිනිශ්චිත විය!

ජනසතු කර්මාන්ත විසුරුවා හැරීම, පුද්ගලික දේපල යලි පිහිටුවීම හා ධනවාදය පුනස්ථාපනය කිරීම යන මේවාට පක්ෂපාතී වූ නිලධරයේ හා වරප්‍රසාදිත නෝමන්ක්ලැචුරාවේ කන්ඩායම්වලට සෝවියට් ආර්ථික අර්බුදය වනාහි සමාජවාදය අසාර්ථක වූ බවටත්, ඔක්තෝබර් විප්ලවය, සෙසු පශ්චාත්කාලීන සෝවියට් බේදවාචකයන් අවශ්‍යයෙන් ම එතුලින් පැන නැංගා වූ ඓතිහාසික වරදක් බවටත් "සාක්ෂියක්" විය. මේ වෙලඳපොල හිතවාදී බලවේග විසින් ඉදිරිපත් කෙරුනු ආර්ථික බෙහෙත් වට්ටෝරු පදනම් වූයේ ස්ටැලින්වාදය ඔක්තෝබර් විප්ලවයේ අනිවාර්ය ප්‍රතිඵලය වී ය යි කියා පෑ සෝවියට් ඉතිහාසය පිලිබඳ අර්ථකථනයක් මත ය.

ධනවාදී පුනස්ථාපනයේ උපදේශකයින්ට දෙන පිලිතුර හුදෙක් ආර්ථික පදනමක් මත පමනක් සැපයිය නොහැකි විය. ඒ වෙනුවට, ධනේශ්වර හිතවාදී තර්ක බන්ධනය, සෝවියට් ඉතිහාසය විභාග කිරීමක්, ස්ටැලින්වාදය ඔක්තෝබර් විප්ලවයේ අවශ්‍ය, නොවැලැක්විය හැකි ප්‍රතිඵලය නොවූ බව විදහාපෑමක් ඉල්ලා සිටියේ ය. ස්ටැලින්වාදයට විකල්පයක් න්‍යායික ව සම්පාදනය කල හැකි ව තිබූ බව පමනක් නො ව ට්‍රොට්ස්කි විසින් නායකත්වය දෙනු ලැබූ වාම විපාර්ශ්වයේ ස්වරූපයෙන් එවැනි විකල්පයක් සත්තකින් ම පැවැති බව ද පෙන්වා දිය යුතු විය.

අද මා කියමින් සිටින්නේ යම් ප්‍රමානයකට 1989 නොවැම්බරයේ දී මොස්කව් විශ්ව විද්‍යාලයීය ඓතිහාසික ලේඛනාගාර ආයතනයේ දී සෝවියට් සංගමයේ සිසුන්ගේ හා ගුරුවරුන්ගේ සභාවකට මා කියූ දෙය ම ය. "සමාජවාදයේ අනාගතය" යන විෂය පිලිබඳ මගේ දේශනය මම මෙසේ සඳහන් කරමින් ඇරඹුවෙමි: "අනාගතය පිලිබඳ සාකච්ඡා කිරීමට නම් සැලකිය යුතු තරම් දුරක් අතීතය පිලිබඳ සිතා බැලීම අවශ්‍ය වන්නේ ය. මක්නිසාද, සමාජවාදී ව්‍යාපාරය හමුවේ පවත්නා බොහෝ නොඑකඟතා සමග ගනුදෙනු නොකර කෙනෙකු කෙසේ නම් අද දවසේ සමාජවාදය ගැන සාකච්ඡා කරන්න ද? තව ද, සත්තකින් ම, සමාජවාදයේ අනාගතය පිලිබඳ සාකච්ඡා කරන කල්හි, අපි ඔක්තෝබර් විප්ලවයේ ඉරනම - ලෝක අර්ථභාරයක් සහිත වූ ද සෑම රටක ම කම්කරු පන්තිය මත ප්‍රගාඪ බලපෑමක් සිදුකලා වූ ද සිදුවීමක් - පිලිබඳ ව සාකච්ඡා කරන්නෙමු. මේ ඉතිහාසයෙන් වැඩි ප්‍රමානයක්, විශේෂයෙන් ම සෝවියට් සංගමය තුල තව මත් අභිරහස් හා සාවද්‍යකරනය තුල සඟවනු ලැබ තිබේ."[1]

එසමයෙහි සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල ඓතිහාසික ප්‍රශ්න පිලිබඳ බලගතු උනන්දුවක් පැවතියේ ය. ඓතිහාසික ලේඛනාගාර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ හදිසි ආරාධනයකට ප්‍රතිචාර වසයෙන් පැය 24කටත් වඩා අඩු සූදානමකින් යුතු ව පැවැත්වුනු මගේ ම දේශනය පවා කිහිප සියයක ජනතාවකගේ ශ්‍රාවකත්වයක් ආකර්ෂනය කරගත්තේ ය. රැස්වීම පිලිබඳ ප්‍රචාරය කට වචනයට සීමා විය. ඇමෙරිකානු ට්‍රොට්ස්කිවාදියකු ආයතනයේ කතාවක් පවත්වතියි යන ආරංචිය වහා පැතිරගිය අතර විශාල සංඛ්‍යාවක පිරිසක් පැමිනියහ.

ග්ලාස්නොස්ට් පිලිබඳ කෙටි කාල සමය තුල ට්‍රොට්ස්කිවාදියකු ප්‍රසිද්ධියේ කතා කිරීම සම්පූර්නයෙන් අලුත් දෙයක් නොවුව ද ඇමෙරිකානු ට්‍රොට්ස්කිවාදියකුගේ දේශනයක් යනු තව මත්

උද්වේගකර දෙයක් විය. එවැනි දේශනයක් සඳහා වූ බුද්ධිමය වාතාවරනය අතිශයින් ම වාසිදායක විය. ඓතිහාසික සත්‍යය උදෙසා සාගින්නක් පැවතිතුනේ ය. සහෝදර ෆ්‍රෙඩ් විලියම්ස් මෑතක දී රොබර්ට් සර්විස්ගේ දූක්මුසු ස්ටැලින් චරිතාපදානය පිලිබඳ සිය විචාරයේ දී සඳහන් කල පරිදි පූර්ව-ග්ලාස්නොස්ට් සමයේ පටන් කුඩා ප්‍රකාශනයක් ව පැවැති තර්ක සහ කරුනු දිගු කලක් තිස්සේ යටපත් කර පැවැති සෝවියට් ඉතිහාසය හා සම්බන්ධ ලියකියවිලි එහි පල කිරීම හේතුවෙන් මිලියන 33ක් දක්වා සිය සංසරනය දැවැන්ත පරිමානයෙන් ඉහල යනු දුටුවේ ය.

මාක්ස්වාදය හා ට්‍රොට්ස්කිවාදය පිලිබඳ පැතිරගිය උනන්දුව දැක භයභීත වූ නිලධරය සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය බිඳවැටීම කරා ගමන වේගවත් කරමින් සමාජවාදී දේශපාලන විඥ්ඥානයේ යලි නැගිටීමකට තුඩු දිය හැකි මේ ඓතිහාසික පැහැදිලි කිරීමේ ක්‍රියාවලිය පූර්වභංග කර දැමීමට ක්‍රියා කලේ ය. සෝවියට් සංගමය දිය කර හැරීම නිලධරය විසින් ක්‍රියාවට නැගුනු නිශ්චිත ආකාරය - අඩ සියවසකටත් පූර්වයෙන් ඔක්තෝබර් විප්ලවයේ ස්ටැලින්වාදී පාවාදීමේ පරිසමාප්තිය ට්‍රොට්ස්කි විසි න් පෙරදකිනු ලැබ තිබිනි - තව මත් අවශ්‍ය විස්තර සහිත ව විභාග කල යුතු ව තිබෙන විෂයකි. එහෙත් අවධාරනය කල යුතු වන්නේ - එහි ව්‍යසනකාරී පලවිපාක කලින් සෝවියට් සංගමයේ පුරවැසියන්ට මනා ව පැහැදිලි වූ - සෝවියට් සංගමය විසුරුවා හැරීම තුල පැවැති තීරනාත්මක මූලිකාංගය වූයේ *ඉතිහාසය පිලිබඳ නොදැනුවත්කම* බව යි. දේශපාලනික ව තමන් දිශාගත වී ගැනීම සඳහා, සිය ස්වාධීන සමාජීය අවශ්‍යතා ඔසවා තැබීම සඳහා සහ සෝවියට් සංගමය විසුරුවා ධනේශ්වර ක්‍රමය පුනස්ථාපනය කිරීමට එරෙහි වීම සඳහා දශක ගනනාවක ඓතිහාසික සාවද්‍යකරනයේ බරබද්දල් නිසිකලට ජයගැනීමට සෝවියට් කම්කරු පන්තියට නොහැකි විය.

මේ ඓතිහාසික බේච්චාවකය තුල දැවැන්ත පාඩමක් ගැබ් ව තිබේ. තමන් පසු කලා වූ ඓතිහාසික අත්දැකීම පිලිබඳ ගැඹුරු ඥානයකින් තොර ව ධනවාදී පද්ධතියට එරෙහි සවිඥ්ඥානික දේශපාලන අරගලයක් දියත් කිරීම තබා සිය වඩාත් ම මූලික සමාජීය අවශ්‍යතා ආරක්ෂා කරගැනීමට වත් කම්කරු පන්තියට බැරි ය.

*ඓතිහාසික විඥ්ඥානය වනාහි පන්ති විඥ්ඥානයේ අත්‍යවශ්‍ය සංරචකයකි.* රෝසා ලක්සම්බර්ග්ගේ වචන, ඒවා ප්‍රකාශයට පත් වුනු, පලමු ලෝක යුද්ධය පුපුරා යාමෙන් හා ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ප්‍රරුසියානු මිලිටරියට හා අධිරාජ්‍යවාදයට යටත් වීමෙන් වසරකට ද අඩු 1915 මුල් භාගය තුල සේ ම අද ද එක සේ අදාල වන්නේ යඃ

"ඓතිහාසික අත්දැකීම ඎකම්කරු පන්තියේ% එක ම ගුරුවරයා වන්නේ ය. ඔහුගේ විමුක්ති ය කරා වූ මාවත වැසී ඇත්තේ කිවනොහෙන තරම් වූ වධවේදනාවන්ගෙන් පමනක් නො ව ගනන් නැති අත්වැරදීම්වලින් ද වේ. ඔහුගේ ගමනේ පරමාර්ථය, ඔහුගේ අවසාන විමුක්තිය සම්පූර්නයෙන් ම රඳා පවතින්නේ නිර්ධන පන්තිය මත ය, එය තමන්ගේ ම වැරදිවලින් ඉගෙනීමට තේරුම්ගෙන තිබේ ද යන්න මත ය. ස්වයං විවේචනය, නපුරෙහි අක්මුල් කරා ම දිවෙන රුදුරු, ක්ෂමා විරහිත විවේචනය වනාහි නිර්ධන පන්තික ව්‍යාපාරයේ ජීවය හා හුස්ම වෙයි. ලෝකය සමාජවාදී නිර්ධන පන්තිය තල්ලු කරදැමූ ව්‍යසනය මනුෂ්‍යත්වයට සිදු වූ අනුපමේය අභාග්‍යයකි. එහෙත් සමාජවාදය පරාජිත වන්නේ නිර්ධන පන්තිය මේ ව්‍යසනයේ ගැඹුර මැන බැලීමට අසමත් වී නම් හා ව්‍යසනය උගන්වන්නා වූ පාඩම් අවබෝධකරගැන්ම ප්‍රතික්ෂේප කරන්නේ නම් පමනකි."[2]

*මතුසම්බන්ධයි.*

## සටහන්

[1] *The USSR and Socialism :The Trotskyist Perspective* (සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය සහ සමාජවාදයඃ ට්‍රොට්ස්කිවාදී ඉදිරිදර්ශනය), ඩෙට්‍රොයිට්, 1990, 1-2 පිටු.

[2] *The Junius Pamphlet*, ලන්ඩන්, 1970, 7පි.

© www.wsws.org